## කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය -2017/2018

## PSC-2239 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය : න්‍යාය හා භාවිතය

**කාලය : පැය දෙකයි (02)**

ප්‍රශ්න **තුනකට ( 03 )** පමණක් පිළිතුරු සපයන්න.

එක් පිළිතුරකට ලැබෙන උපරිම ලකුණු ප්‍රමාණය **විස්සකි (20 ).**

---

01. පහත දෑ පැහැදිලි කරන්න.
    - (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය යන සංකල්පය
    - (ආ) නීතියෙහි ආධිපත්‍යය.

02. (අ) පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය යනු කුමක් ද?
    (ආ) සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය සාකච්ඡා කරන්න.

03. (අ) ස්වදේශ-ජනිත ව්‍යවස්ථාවක් යන්න නිර්වචනය කරන්න.
    (ආ) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ පැවති ස්වදේශ-ජනිත ව්‍යවස්ථා ලක්ෂණ මොනවාදැයි සාකච්ඡා කරන්න.

04. (අ) අධිකරණයේ ස්වාධීනත්වය යන සංකල්පය විභාග කරන්න.
    (ආ) අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා 1978 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වා දී තිබූ විධිවිධාන මොනවා ද?

05. (අ) ඔම්බුඩ්ස්මන් ක්‍රමයේ සම්භවය සහ අරමුණු කෙටියෙන් දක්වන්න.
    (ආ) ශ්‍රී ලංකාවේ ඔම්බුඩ්ස්මන් ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ විභාග කරන්න.

06. පහත සඳහන් දෑ පැහැදිලි කරන්න.
    - (අ) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වා දී ඇති මූලික අයිතිවාසිකම්
    - (ආ) 1978 ව්‍යවස්ථාව මගින් මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හඳුන්වා දී ඇති යාන්ත්‍රනයන්ගේ ක්‍රියාකාරීත්වය.

( අ. පි. බ. )

07. පහත සඳහන් මාතෘකා **දෙකක් (02)** පිළිබඳ සටහන් ලියන්න.

(අ) ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපති ක්‍රමය ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් වර්තමානයේ පවතින විවාද

(ආ) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය

(ඇ) ශ්‍රී ලංකාවේ බලතල බෙදා හැරීමේ අරමුණු

(ඈ) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථා සංශෝධන ප්‍රතිපාදන.

***********************